පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 12

# අවසාන වාර පරීක්ෂණය - 2019

## ක්‍රිස්තියානි ධර්මය (43)

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ..........................................

.......................................................................................................... කාලය : පැය 02 යි.

## I පත්‍රය

**සැලකිය යුතුයි.**

**සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

**නිවැරදි හො වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.**

Education NCP - www.edncp.lk

01. මැසරොටික් පිටපතෙන් බැහැර කර ඇති පොත් කාණ්ඩය වන්නේ,
(1) පංච පුස්තකය යි. (2) ප්‍රධාන දිවැසිවර ග්‍රන්ථ යි. (3) ද්විතීය සම්මත ග්‍රන්ථ යි.
(4) සුළු දිවැසිවර ග්‍රන්ථ යි. (5) එළිදරව් සාහිත්‍යය ග්‍රන්ථ යි.

02. කතෝලික සභාව පුරාණ ගිවිසුම සම්පාදනය කිරීම සඳහා භාවිතා කළ පිටපත වනුයේ,
(1) හීබෲ පිටපත ය. (2) මැසරොටික් පිටපත ය.
(3) සෙප්ටුවා ජින්ත පිටපත ය. (4) වුල්ගාතා පිටපත ය.
(5) ලතින් පිටපත ය.

03. ''අනාවරණය'' සඳහා යෙදෙන ග්‍රීක වචනය වන්නේ,
(1) ඇපොකලිප්ස් (2) නෙයුමා (3) තියෝ
(4) අදමාහ් (5) ඉෂ්ෂා

04. ක්‍රිස්තුන් වහන්සේ පළමු ප්‍රාතිහාර්ය සිදුකළ කානා නුවර පිහිටියේ,
(1) අක්කෝ මිටියාවතේ ය. (2) ජුදා කඳුකරයේ ය.
(3) සමාරියාවේ ය. (4) පෙරයාවේ ය.
(5) දකුණු ගලීලයේ ය.

05. ජෝර්දාන් ගඟ ආරම්භ වන්නේ,
(1) ජුදා කඳුකරයෙන් ය. (2) අක්කෝ මිටියාවතෙන් ය.
(3) ලෙබනන් කඳුවැටියෙන් ය. (4) තාබෝර් කන්දෙන් ය.
(5) ගලීල කඳුකරයෙන් ය.

06. සාවුල්ව රජතුමා ලෙස ජනතාවට හඳුන්වා දෙන ලද්දේ,
(1) මිස්පා හි දී ය. (2) කාර්මෙල් හි දී ය. (3) ජෙරුසලමේ දී ය.
(4) අර්නෝන් හි දී ය. (5) හෙබ්‍රෝන් හි දී ය.

07. උතුරේ වන්දනා ස්ථානවල දෙවියන් වහන්සේ නියෝජනය කිරීම සඳහා සාදන ලද්දේ,
(1) දේව දූතයන් දෙදෙනෙකි. (2) රන් වස්සන් දෙදෙනෙකි.
(3) රිටක් මත වූ සර්පයෙකි. (4) අද්භූත සත්වයෝ දෙදෙනෙකි.
(5) මකරුන් දෙදෙනෙකි.

08. ක්‍රි.පූ. 7 වන සියවසේ පළමු කාර්තු තුනේ දී බලවත් වූ අධිරාජ්‍යය නම්,
(1) ග්‍රීක අධිරාජ්‍යය යි. (2) රෝම අධිරාජ්‍යය යි.
(3) සිරියාව යි. (4) බබිලෝනියාව යි.
(5) අසිරියාව යි.

09. දාවිත් පෙළපතේ අවසාන රජතුමා ලෙස සැලකෙන්නේ.
(1) ජොෂියා රජතුමා ය. (2) දාවිත් රජතුමා ය.
(3) ශෙදකියා රජතුමා ය. (4) මහා ඇලෙක්සැන්ඩර් රජතුමා ය.
(5) ජෙහෝයාකින් රජතුමා ය.

10. සිව්වන ඇන්ටිඕකස් එපිපානෙස් රජතුමා තම රාජ්‍යයේ සංස්කෘතික ඒකත්වය සඳහා සිදුකරන ලද්දේ,
(1) සබත් දින නිවාඩු දිනයක් කිරීම යි. (2) හෙලනිස්තකරණය යි.
(3) චර්මඡේදනය අනිවාර්ය කිරීම යි. (4) ලතින් භාෂාව රාජ්‍ය භාෂාව කිරීම යි.
(5) අලුත් ව්‍යවස්ථාවක් පිහිටුවා ගැනීම යි.

11. මෝසෙස්ගේ මාමණ්ඩිය වූ ජෙත්රෝ හඳුන්වන තවත් නාමයක් වන්නේ.
(1) බුසී ය. (2) අබිනොාන් ය.
(3) කිස් ය. (4) රගුවෙල් ය.
(5) අබෙද්නෙගෝ ය.

12. දිවැසිවර සාහිත්‍යය වැඩි වශයෙන් යොදා ගෙන ඇති සම්ප්‍රදාය වන්නේ,
(1) එලොහිම් සම්ප්‍රදාය ය. (2) යාවේ සම්ප්‍රදාය ය.
(3) ද්විතීය නීති සම්ප්‍රදාය ය. (4) පූජක සම්ප්‍රදාය ය.
(5) වාචික සම්ප්‍රදාය ය.

13. පංච පුස්තකය ග්‍රන්ථාරූඪ කිරීම අවසාන කළ කාලය ලෙස සැලකෙන්නේ,
(1) ක්‍රි.පූ. 1000 දී පමණ ය. (2) ක්‍රි.පූ. 950 දී පමණ ය.
(3) ක්‍රි.පූ. 400 දී පමණ ය. (4) ක්‍රි.ව. 100 දී පමණ ය.
(5) ක්‍රි.ව. 200 දී පමණ ය.

14. ඓතිහාසික හෝ විද්‍යාත්මක නොවන දේවධාර්මික ඉගැන්වීම් සමුදායක් සමන්විත වූ උත්පත්ති පොතට අයත් කොටස වන්නේ,
(1) උත්පත්ති 9-11 ය. (2) උත්පත්ති 12-50 ය.
(3) උත්පත්ති 1-13 ය. (4) උත්පත්ති 1-12 ය.
(5) උත්පත්ති 1-11 ය.

15. අමරණීයභාවය හඟවන මැදපෙරදිග සංකේතයකි.
(1) ඒදන් උයන (2) අමරණීය ඵල
(3) සර්පයා (4) ජීවන වෘක්ෂය
(5) හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගස

16. ගැලවීමේ ඉතිහාසය හා සම්බන්ධව දෙවියන් වහන්සේගේ කැමැත්තෙන් තෝරා ගත් පළමු පුද්ගලයා වන්නේ,
(1) ආදම් ය. (2) ආබ්‍රහම් ය. (3) නෝවා ය.
(4) ක්‍රිස්තුන් වහන්සේ ය. (5) මරියතුමී ය.

17. පොළොවේ සිට ස්වර්ගය දක්වා වූ ඉනිමඟකින් දේව දූතයන් නඟිමින් ද බසිමින් ද සිටින දර්ශනය ජාකොබ් තුමා දුටුවේ,
(1) බෙතෙල් හී දී ය. (2) බෙයර්ෂෙබා හි දී ය.
(3) හේබ්‍රෝන් හී දී ය. (4) පෙනුයෙල් හී දී ය.
(5) මාරා හී දී ය.

18. ජුදා පාස්කුව සැමරිය යුත්තේ,
(1) තුන්වන මාසයේ ය. (2) දෙවන මාසයේ ය.
(3) පළමු මාසයේ ය. (4) පස්වන මාසයේ ය.
(5) හතරවන මාසයේ ය.

19. ඉශ්‍රායෙල් ජනතාව මුහුද තරණය කිරීම හා සම්බන්ධව ඉදිරිපත් කරන ඓතිහාසික අර්ථකථනය වන්නේ,
(1) මෝසෙස් තුමා සැරයටිය ඔසවා අත මුහුදට දිගු කිරීමෙන් මුහුද දෙබෑ වීම යි.
(2) පෙරදිගින් හැමූ සැඩ සුළඟක් මගින් මුහුදු ජලය වියළී යාමට සැලසීම යි.
(3) දෙවියන් වහන්සේ මුහුද දෙබෑ කළ බව යි.
(4) ටිම්ෂා විල ප්‍රදේශයේ වගුරු බිමකට එන්නට ඇති බව යි.
(5) මධ්‍යධරණී මුහුදට කිට්ටුව සිරිබෝනිස් විල ප්‍රදේශයෙන් ගමන් කළ බව යි.

Education NCP - www.edncp.lk

20. කාන්තාර ගමනේ දී අසරණ භාවයට පත්වන සෑම අවස්ථාවක දී ම ඉශ්‍රායෙල් ජනතාවගේ ප්‍රතිචාරය වූයේ,
(1) මෝසෙස් තුමාගේ පිහිට පැතීම ය.
(2) බාල් දෙවියන්ට වන්දනා සිදු කිරීම ය.
(3) අභියෝග භාර ගැනීම ය.
(4) දිව්‍ය සංරක්ෂණය පතා යැදීම ය.
(5) දෙවියන් වහන්සේට මැසිවිලි නැඟීම ය.

21. මොවුන්ගේ නමින් ශුද්ධ බයිබලයේ පොත් නොමැත.
(1) පැරණි දිවැසිවරු
(2) ශාස්ත්‍රීය දිවැසිවරු
(3) සම්භාව්‍ය දිවැසිවරු
(4) ප්‍රධාන දිවැසිවරු
(5) සුළු දිවැසිවරු

22. පුරාණ ගිවිසුමේ ආලේප කරනු ලැබුවෝ නම්,
(1) ආදිපිතෘවරු, දිවැසිවරු හා පූජකවරු ය.
(2) ලෙවීවරු, රජවරු හා වීරවරු ය.
(3) පූජකවරු, රජවරු හා වීරවරු ය.
(4) පූජකවරු, රජවරු හා දිවැසිවරු ය.
(5) වීරවරු, රජවරු හා මෙසියස් වහන්සේ ය.

23. හෙබ්‍රෙව් ව්‍යවහාරයට අනුව රජවරු සාමයේ කාලවල දී නැඟී යන ලද්දේ,
(1) බූරුවන් පිටේ ය.
(2) කොටළුවන් පිටේ ය.
(3) අශ්වයන් පිටේ ය.
(4) ඔටුවන් පිටේ ය.
(5) පෝනියන් පිටේ ය.

24. පාලක පන්තියට අයත් යෙසායාගේ පියා වූයේ,
(1) නාතාන් ය.
(2) එළියා ය.
(3) ආමොස් ය.
(4) හොෂියා ය.
(5) මීකා ය.

25. බැබිලෝනියාවේ විප්‍රවාසයට ගෙන ගිය සෙනඟ අතර සිටි දිවැසිවරයෙකි.
(1) ආමොස්
(2) යෙසායා
(3) ජෙරමියා
(4) එසකියෙල්
(5) ඔබදියා

26. අභිධාර්මික ප්‍රඥාව විග්‍රහ කරන ප්‍රඥා සාහිත්‍යයට අයත් පොතකි.
(1) ජෝබ්ගේ පොත
(2) උත්පත්ති පොත
(3) ද්විතීය නීති සංග්‍රහය
(4) එළිදරව්ව පොත
(5) ප්‍රේම ගී

27. ගීතාවලිය ''සේෆර් තෙහෙලීම්'' ලෙස හඳුන්වන්නේ,
(1) ඉංග්‍රීසි භාෂාවෙනි.
(2) ලතින් භාෂාවෙනි.
(3) හෙබ්‍රෙව් භාෂාවෙනි.
(4) ග්‍රීක භාෂාවෙනි.
(5) ඇරමයික් භාෂාවෙනි.

28. ප්‍රථමවරට ගීතාවලිය පිළිබඳ ගැඹුරු අධ්‍යනයක යෙදුනේ,
(1) එච්. ක්වේන් ය.
(2) ජුලියස් වෙල්හවුසන් ය.
(3) එච්. ග්‍රාන් ය.
(4) සිග්මන් මොවින්කල් ය.
(5) හර්මන් ගුන්කල් ය.

29. ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රධානතම අරමුණ වන්නේ,
(1) ගෝත්‍රය හෝ පවුල ආරක්ෂා කිරීම යි.
(2) ජීවිතය සාර්ථක ලෙසත් දැහැමි ලෙසත් ගෙවීමට මඟ පෙන්වීම යි.
(3) පුද්ගල සිතුම් පැතුම් තේරුම් ගැනීමේ හැකියාව ලබා දීම යි.
(4) විශ්වයේ සංකල්පනා පැහැදිලි කර ගැනීම යි.
(5) ඉශ්‍රායෙල් ජාතියේ විශ්වාසය ප්‍රකාශ කිරිම ය.

30. රෝම පාලනය තුළ ජුදෙව් ජනතාවට නිදහස හිමි වූ ක්ෂේත්‍රය වන්නේ,
(1) ආගමික ක්ෂේත්‍රය යි.
(2) දේශපාලන ක්ෂේත්‍රය යි.
(3) සමාජීය ක්ෂේත්‍රය යි.
(4) ආර්ථික ක්ෂේත්‍රය යි.
(5) බදු ගෙවීම යි.

Education NCP - www.edncp.lk

31. ජුදයාව, සමාරිය හා ඉදුමිය යන ප්‍රදේශවල පාලන බලය හිමි වූ ආණ්ඩුකාරයා වූයේ,
(1) අර්කෙලාවුස් ය. (2) පොන්තියුස් පිලාත් ය.
(3) හෙරෝද් ඇන්ටිපස් ය. (4) අන්නාස් ය.
(5) කයිපාස් ය.

32. ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය ආගමික ගැටළු විසඳීම සඳහා භාවිත කළේ,
(1) දෙවියන් වහන්සේ ය. (2) ජේසුස් වහන්සේ ය.
(3) ස්නාවක ජුවාම් තුමා ය. (4) මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව ය.
(5) ආබ්‍රහම් තුමාගේ විශ්වාසය ය.

33. පහත ප්‍රකාශ හොඳින් කියවන්න.
A මළවුන්ගෙන් නැගිටීම පිළිබඳ විශ්වාස කිරීම
B දේව වචනය නළලේ සටහන් කර ගෙන සිටීම වැදගත් බව සිතීම
C පව් කමා කිරීම පිළිගැනීම
D දේව දූතයන් ගැන විශ්වාස නොකිරීම
ඉහත ප්‍රකාශ අතරින් පරිසිවරුන්ගේ විශේෂ ලක්ෂණ අතරට ගැලපෙන නිවැරදි වරණය තෝරන්න.
(1) B හා C ය. (2) B හා D ය.
(3) A හා B ය. (4) C හා D ය.
(5) A හා D ය.

34. එසේනිවරුන්ගේ ජීවිත පැවැත්මේ විශේෂතා අතරට අයත් **නොවන** පිළිතුර වන්නේ,
(1) විවාහ වීම (2) පොදුවේ වැළඳීම
(3) නායකයාට කීකරු වීම (4) සුදු වස්ත්‍ර ඇඳීම
(5) පොදු වැඩ කිරීම

35. සුබාරංචි ලේඛන ගත කිරීමේ පළමු අදියරට අයත් කාලය වන්නේ,
(1) ක්‍රි.පූ 6-33 අතර කාලය යි. (2) ක්‍රි.පූ 4-33 අතර කාලය යි.
(3) ක්‍රි.පූ 33-50 අතර කාලය යි. (4) ක්‍රි.පූ 0-30 අතර කාලය යි.
(5) ක්‍රි.ව 0-33 අතර කාලය යි.

36. පංච පුස්තකය අභාෂය කර ගනිමින් නව ගිවිසුමේ කෘතියක් සම්පාදනය කළේ,
(1) ශු. පේදුරු තුමා ය. (2) ශු. පාවුලු තුමා ය.
(3) ශු. මතෙව් තුමා ය. (4) ශු. ලූක් තුමා ය.
(5) ශු. ජොහාන් තුමා ය.

37. ශාස්ත්‍රවන්තයනගේ පැමිණීම පිළිබඳව සඳහන් කරන්නේ,
(1) මතෙව් තුමා හා ලූක් තුමා ය. (2) මතෙව් තුමා පමණි.
(3) ලූක් තුමා පමණි. (4) ජොහාන් තුමා පමණි.
(5) මාක් තුමා හා ලූක් තුමා ය.

38. ගැලවීමේ ඉතිහාසය එළිදක්වන නව ගිවිසුමේ ඇති ග්‍රන්ථය වන්නේ,
(1) අපෝස්තුළුවරුගේ ක්‍රියා පොත ය. (2) ජොහාන් සුබාරංචිය ය.
(3) එළිදරව්ව පොත ය. (4) ලූක් සුබාරංචිය ය.
(5) 1 කොරින්ති ලිපිය ය.

39. පාවුලුතුමා ප්‍රගුණ කළ නවීන කර්මාන්තය වූයේ,
(1) රුවල් ඔරු සෑදීම ය. (2) සම් භාණ්ඩ සෑදීම ය.
(3) වඩු කර්මාන්තය ය. (4) කුඩාරම් කර්මාන්තය ය.
(5) වයින් සෑදීම ය.

40. ප්‍රථම වතාවට ශ්‍රාවකයින් ක්‍රිස්තියානිින් නමින් හඳුන්වනු ලැබුවේ,
(1) පලස්තීනයේ දී ය. (2) කොරින්තියේ දී ය.
(3) ගලාතියේ දී ය. (4) රෝමයේ දී ය.
(5) අන්තියෝකියේ දී ය.

Education NCP - www.ednce.lk

41. කිතුනුවකු වීම සඳහා ජාතිය වැදගත් නොවන බව තේමාව කොට ගනිමින් පාවුලුතුමා ලියූ ලිපිය වන්නේ,
(1) තිමෝතියස්ට යැවූ ලිපිය යි. (2) ගලාති ලිපිය යි.
(3) පිලමොන් ලිපිය යි. (4) එපීස ලිපිය යි.
(5) තෙසලෝනික ලිපිය යි.

42. ''ශ්‍රාවකයන්'' සඳහා යොදන ග්‍රීක වචනය වන්නේ,
(1) අපොස්ටොලොස් ය. (2) ප්‍රේරිතයන් ය.
(3) මතටේස් ය. (4) අපෝසලස් ය.
(5) ඇපොකලිෂ්ට ය.

43. දේව රාජ්‍යයේ ස්වභාවය පැහැදිලි කිරීම සඳහා මතෙව් තුමා දක්වන උපමා ගණන,
(1) තුනකි. (2) පහකි.
(3) හතකි. (4) දහයකි.
(5) දෙකකි.

44. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ කුලියට වැඩ කළ අයෙකුගේ දිනක වැටුප වූයේ,
(1) ඩ්රැක්මා දෙකකි. (2) තලෙන්තුවකි.
(3) තුට්ටුවකි. (4) ඩිනාරි එකකි.
(5) ඩිනාරි දහයකි.

45. මතෙව් තුමා ඉදිරිපත් කරන අවසාන කාලයේ ස්වභාවය කියැවෙන උපමා අතරට අයත් **නොවන්නේ**,
(1) අත්තික්කා ගස පිළිබඳ උපමාව ය. (2) ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ උපමාව ය.
(3) යුවතියන් දස දෙනා පිළිබඳ උපමාව ය. (4) දැල පිළිබඳ උපමාව ය.
(5) කෙතෙහි වූ මනුෂ්‍යයන් දෙදෙනා පිළිබඳ උපමාව ය.

46. ජුදාස් ජේසුස් වහන්සේ තක්සේරු කළේ,
(1) වහලෙකුගේ වටිනාකමට ය. (2) පව්කරුවකුගේ වටිනාකමට ය.
(3) මනුෂ්‍යයකුගේ වටිනාකමට ය. (4) රන්කාසි පනහකට ය.
(5) මිලදී ගැනීමට නියමිත ඉඩමේ වටිනාකමට ය.

47. ගෙත්සෙමෙනි උයන,
(1) මල් වත්තකි. (2) යාච්ඤා කරන ස්ථානයකි.
(3) පලතුරු වත්තකි. (4) රට ඉඳි වත්තකි.
(5) මිදි වත්තකි.

48. ගීතාවලිය 22/1 සිහිගන්වමින් ජේසුස් වහන්සේ කුරුස ගසේ දී ප්‍රකාශ කළ යැදුමකි.
(1) මාගේ අත්මය ඔබගේ හස්තවලට භාර කරමි.
(2) මම පිපාස වෙමි.
(3) සියල්ල අවසාන ය.
(4) මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මන්ද
(5) අද ඔබ මා සමඟ පාරාදීසයේ සිටින්නෙහි ය.

49. දෙමාපියන්ට ගරු කිරීම දේව නියමයක් බව පෙන්වා දෙන ශුද්ධ බයිබලයේ ග්‍රන්ථ අතර එකකි.
(1) උත්පත්ති පොත (2) ද්විතීය නීති සංග්‍රහය
(3) ගණන් කතාව (4) දානියෙල් පොත
(5) ජෝබ්ගේ පොත

50. ''කවර පරිසරයක දී වත් වෙනස් නොවන'' යන අර්ථය දැක්වීමට යෙදෙන ග්‍රීක වචනය,
(1) සෙගුල්ලාහ් ය. (2) කඩෝෂ් ය.
(3) හොක්මා ය. (4) අගපේ ය.
(5) ඊසා ය.

***

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 12 |

# අවසාන වාර පරීක්ෂණය - 2019
## ක්‍රිස්තියානි ධර්මය (43)

පාසලේ නම : ..............................................................................................
ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ...............................................
.............................................................................................................. කාලය : පැය 03 යි.

## II පත්‍රය

**සැලකිය යුතුයි.**

**I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

### I කොටස

01. (i) ශුද්ධ බයිබලය අනෙක් පොත්වලින් වෙනස් වීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 1 x 2 = 2 යි.)

(ii) පුරාණ ගිවිසුමේ සම්මත ග්‍රන්ථාවලිය පිළිබඳ මත භේද ඇති වීමට හේතු **දෙකක්** පෙන්වා දෙන්න. (ලකුණු 2 x 2 = 4 යි.)

(iii) දේවානුභාවයේ ප්‍රභේද **තුන** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2 x 3 = 6 යි.)

(iv) ශුද්ධ බයිබලය තුළින් ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට ලැබෙන මඟපෙන්වීම් **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 2 x 4 = 8 යි.)

02. (i) ප්‍රාග් ඉතිහාසය සම්පාදනය කිරීමට දායක වූ සම්ප්‍රදායන් **දෙකක්** ලියන්න. (ලකුණු 1 x 2 = 2 යි.)

(ii) ඔබ ඉහත නම් කළ සම්ප්‍රදායන්ගෙන් එකක භාෂා ශෛලිය පිළිබඳ කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 2 x 2 = 4 යි.)

(iii) මෝසෙස් තුමා හා පංච පුස්තකය අතර සම්බන්ධතාවයක් ඇති බවට පිළිගෙන ඇති හේතු **තුනක්** දක්වන්න. (ලකුණු 2 x 3 = 6 යි.)

(iv) ඔබගේ පාසලේ සිටින මිතුරෙකුට පංච පුස්තකයේ ඇති වැදගත්කම කරුණු **හතරකින්** විස්තර කරන්න. (ලකුණු 2 x 4 = 8 යි.)

03. (i) පැරණි දිවැසිවරු කළ කී දෑ සඳහන් වන බයිබලීය ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න. (ලකුණු 1 x 2 = 2 යි.)

(ii) පැරණි දිවැසිවරුන්ගේ දූත මෙහෙවරෙහි දක්නට ලැබෙන මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 2 x 2 = 4 යි.)

(iii) දිවැසිවර ඉගැන්වීමෙහි ප්‍රධාන තේමා **තුන** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2 x 3 = 6 යි.)

(iv) වර්තමාන සමාජය තුළ දිවැසිවරයෙකු ලෙස ඔබ ක්‍රියා කරන ආකාරය කරුණු **හතරකින්** විස්තර කරන්න. (ලකුණු 2 x 4 = 8 යි.)

Education NCP - www.edncp.lk

## II කොටස

04. (i) පලස්තීන සමාජයේ බොහෝ වරප්‍රසාද අභිමි පුද්ගල කණ්ඩායම් **පහක්** පිළිබඳව වෙන වෙනම විස්තර කර දක්වන්න.

(ii) ඔබගේ පන්තියේ සියලු දෙනා විසින් කොන් කරන ලද ශිෂ්‍යයකු වෙනුවෙන් ඔබ කිතුනුවකු ලෙස කටයුතු කරන්නේ කෙසේදැයි කරුණු **පහක්** ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි.)

05. (i) නික්මයාම සිද්ධිය මැවීම පිළිබඳ දෙවන කතාව හා සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. මෙය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ii) දෙවියන් වහන්සේගේ දිව්‍ය සංරක්ෂණය ඉශ්‍රායෙල් ජනතාවට පමණක් නොව අප වෙතට ද ගලා එයි. ඔබ දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථාවක් විස්තර කර දක්වන්න.

(ලකුණු 20 යි.)

06. (i) පාවුලු තුමාගේ ප්‍රථම ධර්මදූත චාරිකාවේ ප්‍රධාන අරමුණ පෙන්වා දී, එහිදී ඔහු අත්දුටු යහපත් ප්‍රතිඵල **දෙකක්** හා අයහපත් ප්‍රතිඵල **දෙකක්** විස්තර කරන්න.

(ii) පාවුලු තුමාගේ ජීවිතයෙන් වර්තමානයේ ජීවත්වන කිතුනුවන්ට ලබා ගත හැකි ආදර්ශ **පහක්** විස්තර කරන්න.

(ලකුණු 20 යි.)

07. (i) ශුද්ධ වූ ජොහාන් තුමාගේ සුවිශේෂයේ සඳහන් ''මම වෙමි'' ප්‍රකාශන **පහක්** දක්වා එයින් සමාජයට ලැබෙන පණිවිඩය පැහැදිලි කරන්න.

(ii) කිතුනු දරුවකු ලෙස සමාජය තුළ සත්‍යවාදීව කටයුතු කිරීමට යාමේදී ඔබට එල්ල විය හැකි අභියෝග **පහක්** සඳහන් කර, එම අභියෝග හමුවේ ඔබ ක්‍රියා කරන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 20 යි.)

08. (i) ශුද්ධ වූ මාක් තුමාගේ සුවිශේෂයට ආවේණික ලක්ෂණ **පහක්** විස්තර කරන්න.

(ii) ''ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය හා මරණය තුළින් ජීවිතය හා මරණය පිළිබඳ මනා අවබෝධයක් ලබා දීමට මාක් තුමාගේ සුවිශේෂය මහගු පිටුවහලකි.'' මෙම කරුණ සනාථ කරමින් ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතට වචන **125ක** පමණ ලිපියක් සකස් කරන්න.

(ලකුණු 20 යි.)

***

Education NCP - www.edncp.lk